HC TAB 2972/21 නඩුව පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චූදිතයන් 25 දෙනෙකුට එරෙහිව, මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත, මහාධිකරණ විනිසුරු අමල් රණරාජා හා මහාධිකරණ විනිසුරු නවරත්න මාරසිංහ යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ලක් හමුවේ කොළඹ මහාධිකරණයේදී අද දින (3) කැඳවන ලදී. පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය මෙදින නිළ වශයෙන් ආරම්භ කරන ලදී. විත්තිකරුවන්ගේ ඇප ඉල්ලීම් සඳහා විරෝධතාවය දක්වමින් අතිරේක සොලිසිටර් ජෙනරාල්තුමිය (එච්.ජයසුන්දර) ලිඛිත දේශන ඉදිරිපත් කරන ලදී. වැඩිදුර පූර්ව නඩු විභාගය සහ ඇප සම්බන්ධ නියෝගය සඳහා මෙම නඩුව 2022 වර්ෂයේ නොවැම්බර් මස 24 වන දින, පස්වරු 2ට කැඳවීමට නියමිතය.